## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

## අධ්‍යක්ෂ ජනරාල් තනතුර (HM 2-1)

**ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### රැකියා පිරිවිතරය :-

ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ නියාමන කටයුතු, සංවර්ධන කටයුතු හා ප්‍රවර්ධන කටයුතු ඇතුළු සියලු ක්‍රියාකාරකම් මණ්ඩලයේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ මගපෙන්වීම හා පාලනය යටතේ සිදුකිරීමටත්, ආයතනයේ අභ්‍යන්තර පරිපාලනය, මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම මෙම තනතුරට පැවරී ඇත.

### අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-

**බාහිර අයදුම්කරුවන් :-**

(අ) ආර්ථික විද්‍යාව / කළමනාකරණය / වාණිජ්‍ය / කෘෂිකර්මය / විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය දෙමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් පශ්චාත් (විද්‍යාපති) උපාධි සුදුසුකමක් ලබා තිබීම.

සමග

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් අනතුරුව පිළිගත් ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිතව අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර 20ක සනාථ කළහැකි කාර්යක්ෂම සේවා පළපුරුද්ද සහිත වීම.

සමග

විවිධ කාර්යයන්හි නිරත කණ්ඩායම්වලට නායකත්වය සපයමින් ඔවුන් මෙහෙයවීම පිළිබඳව සහ මානව සම්පත හා අනෙකුත් සම්පත් ප්‍රතිඵලදායක ලෙස හා කාර්යක්ෂම ලෙස මෙහෙයවීම පිළිබඳ සනාථ කළහැකි කාර්ය සාධනය ඇති අයෙකු වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව මට්ටමේ (තේ කොමසාරිස්වරයෙකු වශයෙන් හෝ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්) හෝ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

සමග

විවිධ කණ්ඩායම්වලට නායකත්වය සපයමින් ඔවුන් මෙහෙයවීම පිළිබඳව සහ මානව සම්පත හා අනෙකුත් සම්පත් ප්‍රතිඵලදායක ලෙස හා කාර්යක්ෂම ලෙස මෙහෙයවීම පිළිබඳ සනාථ කළහැකි කාර්ය සාධනය ඇති අයෙකු වීම.

### වැටුප් පරිමාණය :-

**HM 2-1-02/2016 රු. 91,645 - 12 x 2700 - රු. 124,045**

**කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි ප්‍රතිපාදන අනුව රු. 91,645/- ආරම්භක මාසික වැටුප මත පිහිටුවා එම වැටුපද එයට අමතරව මාසිකව රු. 7,800/- ජීවන වියදම් දීමනාවද චක්‍රලේඛ ප්‍රකාරව** වෘත්තීය දීමනාවද ගෙවනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 අනුව ඉන්ධන දීමනාව සහිතව මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන රියදුරෙකු සහිත වාහනයක් අනුයුක්ත කිරීමට හෝ ප්‍රවාහන දීමනාව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

### වයස් සීමාව :-

අවුරුදු 40 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

### වෙනත් ප්‍රතිලාභ :-

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ / ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ / ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

### පොදු කොන්දේසි :-

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

### අයදුම් කිරීම :-

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **www.srilankateaboard.com** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග **2023 ජූනි 22** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.


සභාපති,

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**

අංක. 574, ගාලුපාර,

කොළඹ 03.